# බළන්ගොඩ නගර සභාව

## 2022-02-22 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.02.22**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රීනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී නී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ අතර, නොවැළැක්විය හැකි හේතුවක් නිසා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අද දින විශේෂ සභාවට නොපැමිණෙන බව

දන්වා ඇති බව ද මේ වන විට මාළු කඩ සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇති අතර, ගරු නාගරික මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ ඉල්ලීම මත මෙදින විශේෂ මහ සභාව පවත්වන බව ද පවසන ලදී.

**01. බළන්ගොඩ පොදු වෙළඳපොළේ මාළු කඩ සම්බන්ධව ඇති වී ඇති ගැටළුව සාකච්ඡා කර, තීරණයක් ගැනීම සහ ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වෙළඳසැල අංක 09 හා 10 කඩ කාමර සඳහා නඩුවක් පැවති අතර, එම නඩුව කෙදිනක අවසන් වේ දැයි නොදන්නා බව ද පොදු වෙළඳසැල අලුතින් සකස් කිරීමට සැලසුම් කර ඇති අතර, ටෙන්ඩර් ක්‍රමය මඟින් කඩ විශාල ප්‍රමාණයක් ලබා දීමට අපේක්ෂා කරන බව ද එම අවස්ථාව ලැබෙන තුරු වැඩි වූ තක්සේරු මුදලට පොදු වෙළඳසැල අංක 09 හා 10 කඩ කාමර හැර ඉතිරි මාළු කඩ ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීමත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටත් මෙම යෝජනාව ඉදිරිපත් කරන බව ද ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය නොලැබුණහොත් ටෙන්ඩර් කරන බව ද පවසන ලදී.

**පෙ.ව. 10.09 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 10.10 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව. 10.18 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, නීත්‍යානුකූල තත්ත්වය කුමක්දැයි විමසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, මෙම කඩ කාමර අනිවාර්යයෙන්ම ටෙන්ඩර් කළ යුතු බව ද ටෙන්ඩර් නොකළහොත් අධිභාරයකට ලක් විය හැකි බව ද ඒ සම්බන්ධව එවා ඇති ලිපි ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා ලබා දී ඇති බව ද මෙම යෝජනාව මඟින් වැරදි දෙයක් නොඉල්ලන අතර, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට සභා අනුමැතිය යොමු කිරීම සිදු කරන බව ද යම්කිසි ගැටලුවක් හෝ විරෝධතාවයක් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළඳසැල අලුතින් ඉදි කරන බව හා කඩ කාමර වැඩි කරන බව පැවසූ නමුත් 2022 වර්ෂයේ දී ගරු මුදල් අමාත්‍යතුමා විසින් කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කිරීමට මුදල් ලබා නොදෙන බව පැවසූ බව ද පසුගිය කාලයේ දී මෙම ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමට මුදල් අනුමත වූ නමුත් දේශපාලන හේතුන් මත නැවතුණු බව ද 2019/2020 කාලයේ දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් පැරණි පොදු වෙළඳසැල පවතින භූමි ප්‍රදේශය පරීක්ෂා කර, ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය කරන අවම කඩ ප්‍රමාණය ආදී කරුණු රැසක් පිළිබඳව අවධානය යොමු කළ බව ද එම කාලයේ ඉදි කිරීම් සඳහා වැය වන මුදලට වඩා තුන් ගුණයක මුදලක් අද වන විට වැය වන බව ද පවතින

ගැටලු මත එම ස්ථානයේම පොදු වෙළඳසැල ඉදිවන්නේ ද? ඉදිවන්නේ කවදාද? වියදම් ඇස්තමේන්තුව සකස් කර ඇත් ද? ඉදිරි මාස 07 ක කාලය තුළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකට යන බැවින් මෙම ව්‍යාපෘතිය ඉටු කර ගත හැකි ද? යන ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු අපේක්ෂා කරන බව ද මාළු කඩ සම්බන්ධ නඩුව දිනූ නමුත් නැවත නීතිඥවරුන්ගේ හැකියාව මත අභියාචනාධිකරණයට නඩුව යොමු කර ඇති බව ද තානායම සම්බන්ධව තීරණයේ දී ආණ්ඩුකාරතුමා එය වසරකින් හෝ දෙකකින් දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දුන්නා සේ මෙම ගැටලුවේ දීත් ටෙන්ඩර් නොකරන ලෙස පැවසුවහොත් එම නියෝගය ජයසේකර යන අය ප්‍රයෝජනයට ගෙන උසාවියට යා හැකි බව ද නගර සභාවට අයවීමට ඇති කෝටි ගණනක වන්දි මුදල නගර සභාව විසින් ජයසේකර යන අයට ගෙවීමට සිදු විය හැකි බව ද පළාත් පාලන නීතියට හා චක්‍රලේඛ අනුව ටෙන්ඩර් කිරීමට තමන් පක්ෂ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, අවුරුදු 04 ක් න්‍යාය පත්‍රානුකූලව වැඩ කටයුතු කළ අතර, අද න්‍යාය පත්‍රයේ යෝජනාවට ඇතුලත් කරුණ සම්බන්ධයෙන් නොව 90%ක් පැවසුවේ වෙනත් කරුණක් සම්බන්ධව බව ද පොදු වෙළඳසැල සඳහා සැලැස්මක් පවතින අතර, එම මුදල වැඩි විය හැකි බව ද හිටපු ගරු සභාපති ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමෙහි බස් නැවතුම්පළ ඉදි කිරීමේ දී අනුගමනය කළා සේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ හැකි බවද රජයෙන් මුදල් ලබා නොදෙන බව පැවසුව ද පොදු වෙළඳසැලෙහි දැනට ව්‍යාපාර කරන වෙළෙඳ ව්‍යාපාරිකයන්ගෙන් කී මනි ලබා ගෙන කළ හැකි බව ද අද වන විට මාළු කඩ ටෙන්ඩර් කරන ලෙස පැවසුව ද කඩ හිමියා කතා කර ගත නොහැකිව අංශබාග රෝගයෙන් රත්නපුර රෝහලේ ප්‍රතිකාර ලබා ගන්නා බව ද මානුෂිකව සිතන නමුත් නීතිය ඒ සඳහා හරස් වන බව ද කෙසේ වෙතත් මානුෂිකව සිතිය යුතු බව ද ලබා ගත්තා වූ තීරණ හේතුවෙන් මෙපමණ කාලයකට අධිභාරයකට ලක් නොවූ බව ද මාළු කඩ ටෙන්ඩර් නොකර වැඩි වන තක්සේරු මුදල ගෙවීම සඳහා සහ අනුමැතිය ලබා දෙන ලෙස ද ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටද අනුමැතිය ලබා නොදී ටෙන්ඩර් කරන ලෙස දැන්වුවහොත් ටෙන්ඩර් කරන බව ද අවශ්‍ය නම් බෙදීමකට යා හැකි බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසුවේ මාළු කඩ පොදු වෙළඳසැලෙහි පමණක් නොව පිටත ද පවතින බැවින් ඇතුලත කඩ පමණක් ටෙන්ඩර් කිරීමෙන් අසාධාරණයක් සිදු වන අතර, පිටත පවතින කඩ පොදු වෙළඳසැල තුළට ගත යුතු බවයි.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, පොදු වෙළඳසැලෙහි කඩ වැඩි වන විට එම කඩ හිමියන්ටද පොදු වෙළඳසැලෙහි කඩ ලබා දිය හැකි බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෙම පුද්ගලයන් මාළු කඩවල සිටි කාලය පිළිබඳව දැනුවත් කරන ලෙස ද මෙහි ඉතිහාසය ගැන පැවසීමේ දී නගර සභාවේ නීති රීති උල්ලංඝනය කර කඩ පවත්වාගෙන යාම හේතුවෙන් පියදාස මුදලාලි යන අයට නඩු පවරන ලද්දේ තමන් බව ද එවකට සිටි ගරු මහ ඇමතිතුමාගෙන් ඒ සඳහා අනුමැතිය ලබා ගත් බව ද එසේ නොවුනේ නම් තමන් වැරදි කාරයෙක් වන බව ද මෙම කරුණු දිගින් දිගටම

පැවසුවහොත් ශාන්ත ජෝන් වෙළඳසැලේ ගත් තීන්දු කිව හැකි නමුත් අද දින වෙනත් දෙයක් පිළිබඳව කතා කෙරෙන නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන බව ද පැවසීය.

එමෙන්ම මාළු කඩෙහි පැරණිම පුද්ගලයා පේමදාස මුදලාලි වන අතර, ඔහුගෙන් මාළු මිල දී ගෙන පියදාස මුදලාලි වෙළඳාම සිදු කළ බව ද ඉන්පසු මෙම කඩ ටෙන්ඩර් නොකර දිගින් දිගටම පවත්වාගෙන ආ අතර, පියදාස මුදලාලි යන අය විසින් නඩුවක් ඉදිරිපත් කිරීමත් සමග මෙම කඩ ටෙන්ඩර් කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා නියෝගයක් ලබා දුන් බව ද මේ වන විට නගර සභාව විසින් කඩ තක්සේරු කිරීමේ දී 300% කින් පමණ කුලිය වැඩි කර ඇති බව ද කඩයක මාසික කුලිය රු. 8,500.00 සිට රු. 21,000.00 දක්වා වැඩි වී ඇති බව ද මාළු කඩ හිමියන් විසින් පසුගිය මාස දෙකට කුලිය ගෙවා ඇති අතර, වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවා ඇති බව ද ශ්‍රී ලංකාවේ සෑම ස්ථානයකම ධීවර සංස්ථාවන් ඇති කළ නමුත් බළන්ගොඩ පමණක් එය ඇති කිරීමට ඉඩ නොදුන්නේ බළන්ගොඩ පුද්ගලයන් ජීවත් විය යුතු නිසා බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් එක් අයෙකු නිවාස උකස් කර, වාහන ලීසිං කර, ණය වී ඇති නිසා මෙම මාළු කඩ ටෙන්ඩර් කරන ලෙස පැවසීමත් සමග ඇති වූ කම්පනය හේතුවෙන් අංශබාග රෝග තත්ත්වයකට පත් වී රත්නපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින බව ද එබැවින් මානුෂිකව බැලිය යුතු බව ද හිටපු ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා පැවසූ පරිදි නීතිඥයාගේ දක්ෂතාවය මත එතුමා වසරක කාලයක් තනතුරෙහි සිටි බවද නීතිඥයින් විසින් මුදල් ගැනීම සඳහා ඕනම දෙයක් කරන බව ද පොදු වෙළඳසැල මේ වන විට වැස්සට තෙමෙන අතර, අලුත්වැඩියා කළ යුතු බව ද එහි වැසුණු මාළු කඩ ඇති අතර, එම කඩ නැවත විවෘත කළ යුතු බව ද පොදු වෙළඳසැල නොවැසිය යුතු අතර, පදික කඩ ඉවත් කළ යුතු බව ද මේ නිසා මහජන පොළෙහි වෙළඳුන් අසරණ වී ඇති බව ද ආඥා පනත අනුව කටයුතු කළ යුතු බවද පවසන ලදී.

එබැවින් මාළු කඩ සඳහා මාස දෙකක් කුලිය ලබා ගෙන ඇති බැවින් මේ සම්බන්ධව මානුෂිකව බලන ලෙස ද ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පොදු වෙළෙඳසැල අංක 09 හා 10 කඩ කාමර හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් නොකර, දැනට සිටින බදුකරුවන් වෙතම නව තක්සේරු මුදලට ලබා දීම සඳහා වන යෝජනාවට පක්ෂ හා විපක්ෂ බව විමසීම සඳහා බෙදීමක් ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පොදු වෙළෙඳසැල අංක 09 හා 10 කඩ කාමර හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් නොකර, දැනට සිටින බදුකරුවන් වෙතම නව තක්සේරු මුදලට ලබා දීම සඳහා වන යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන්

බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් එකළොස් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ජී. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් එක් අයෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතතුමා ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, පහත සඳහන් සභිකවරුන් පස්දෙනා සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පොදු වෙළෙඳසැල අංක 09 හා 10 කඩ කාමර හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් නොකර, දැනට සිටින බදුකරුවන් වෙතම නව තක්සේරු මුදලට ලබා දීම සඳහා වන යෝජනාව පක්ෂව ඡන්ද 11ක් ද, විපක්ෂව ඡන්ද 01 ක් ද වශයෙන් වැඩි ඡන්ද 10 කින් සභා සම්මත විය.

**2. 2022 අයවැය මගින් මන්ත්‍රී යෝජනා සඳහා වෙන් කළ මුදලින් අඩු ආදායම්ලාභීන් වෙත බඩු මලු බෙදා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඕනෑම මන්ත්‍රීවරයෙකුට කැමති නම් තමන්ට වෙන් වී ඇති මුදලින් අඩු ආදායම්ලාභීන්ට බඩු මලු බෙදා දීමට හැකි අතර, එසේ කරන්නේ නම් සභා අනුමැතියක් ලබාගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කර එතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බව ද තමන්ට වෙන් වී ඇති මන්ත්‍රී යෝජනා සඳහා වෙන් වූ මුදලින් කැමති මුදලක් යොදවා සිදු කළ හැකි බව ද එසේ නොමැති නම් තවත් මුදල් පවතින බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් අද න්‍යාය පත්‍රයෙහි සඳහන් කාරණා සඳහා විශේෂ සභාවක් රැස් කිරීමට අවශ්‍ය නොවන අතර, පසුගිය සභාවේ දී මාළු කඩ ටෙන්ඩර් කිරීමට සම්මත වූ නමුත් අද නැවතත් ටෙන්ඩර් නොකරන ලෙස පවසන බව ද රටේ පවතින ආර්ථික තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් පහත වැටෙන බැවින් ජනතාවගේ ජීවන වියදම ඉහළ ගොස් ඇති බව ද එවැනි වාතාවරණයක් තුළ මහජනතාවගෙන් අය කරනු ලබන බදු මුදල් කාලයක් පවතින කටයුත්තකට යොදවන්නේ නම් ජනතාවට එය භුක්ති විඳීමට හැකි වන බව ද එක් බඩු මල්ලක් ලබා දී එය එතනින් අවසන් වූ පසු මිනිසුන්ට එය අමතක වන අතර, මුදල් නාස්තියක් වන බව ද පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ එසේ නම් කොම්පෝස්ට් අංගනයේ අය හට බඩු මලු ලබා දීම අවශ්‍ය නොවන බවයි.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, එම මිනිසුන් නගරය පිරිසිදුව පවත්වාගෙන යාමට කැප වෙන පිරිසක් බැවින් ඇගයීමක් වශයෙන් බඩු මලු ලබා දුන් බව ද තමන් හැර අනිකුත් ගරු මන්ත්‍රීවරුන් මේ සඳහා කැමති විය හැකි අතර, එක් දිනක් හෝ හරියකට වැඩ කර පසුවදා ගෙදර ගියත් ප්‍රශ්නයක් නැති බව ද වරප්‍රසාද හෝ ගෞරවය අවශ්‍ය නොවන බව ද අවශ්‍ය වන්නේ මිනිසුන්ට හරි දේ කිරීම බැවින් බඩු මලු බෙදා දීමේ යෝජනාවට තම විරෝධතාවය ප්‍රකාශ කරන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් බඩු මලු බෙදා දීමට අමතරව නිවාස ආධාර ලබා දීම වශයෙන් එකතු කිරීමක් කරන ලෙස පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුවේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිළධාරී සහ සමෘද්ධි සංවර්ධන නිළධාරී නිර්දේශය මත බඩු මලු බෙදා දිය හැකි බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා, බඩු මලු බෙදා දීමේ යෝජනාවට පක්ෂ හා විපක්ෂ බව විමසීම සඳහා බෙදීමක් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 අයවැය මගින් මන්ත්‍රී යෝජනා සඳහා වෙන් කළ ලක්ෂ 10 ක මුදල් සීමාවට යටත්ව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අඩු ආදායම්ලාභීන් සඳහා බඩු මලු බෙදා දීමේ යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් එකළොස් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් එක් අයෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතතුමා ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, පහත සඳහන් සභිකවරුන් පස්දෙනා සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

ඒ අනුව 2022 අයවැය මගින් මන්ත්‍රී යෝජනා සඳහා වෙන් කළ ලක්ෂ 10 ක මුදල් සීමාවට යටත්ව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අඩු ආදායම්ලාභීන් සඳහා බඩු මලු බෙදා දීමේ යෝජනාව පක්ෂව ඡන්ද 11ක් ද, විපක්ෂව ඡන්ද 01 ක් ද වශයෙන් වැඩි ඡන්ද 10 කින් සභා සම්මත විය.

මෙහි දී අදහස් දක්වූ ගරු සභාපතිතුමා සභාව පවතින පළමු කාර්තුව තුළ මෙම සියලු කටයුතු සිදු කළ යුතු බැවින් පොදුවේ සියලුම මන්ත්‍රීවරයෙකුටම අදාල වන පරිදි මෙම විශේෂ අවසරය ලබා දීමට අද දින විශේෂ මහ සභාව පවත්වන්නට යෙදුණු බව පවසන ලදී.

**3. 2022 මාර්තු 18 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම වෙනුවෙන් නගර සභා ක්‍රීඩාංගනය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම ඉල්ලීම පෙර දිනයේ ලැබුණු බව ද ගරු ආණ්ඩුකාරතුමා නිවිතිගල සංගීත ප්‍රසංගයක ඇති වූ තත්ත්වය පිළිබඳව පවසමින් බළන්ගොඩත් එවැනි දෙයක් සිදු කර ගන්නවා ද යන්න විමසූ බව ද මෙය සභාවට පමා වී ඉදිරිපත් කිරීමට නොහැකි බැවින් අද දින විශේෂ සභාවට යෝජනාව යොමු කරන බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස තමන්ට පැවසූ බවද මෙය නීතිමය වශයෙන් ලබා දිය හැකි නමුත් පවතින තත්ත්වය මත සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ලබා දෙන්නේ නම් ලබා දීමට සිදු වන බව ද සභාවට රු. 25,000.00 ක මුදලක් ලබා දෙන බව පැවසූ අතර, ටිකට් අලෙවි කර සංගීත ප්‍රසංගය පවත්වන බව ද තමන්ට තනි තීරණයක් ගත නොහැකි බැවින් සභාවට ඉදිරිපත් කරන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් සභාවට ආදායමක් ලැබෙන බැවින් රටේ පවතින තත්ත්වය මත සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව පිට්ටනිය ලබා දිය හැකි නම් ලබා දෙන ලෙස ද අලාභ හානියක් සිදු වුවහොත් අය කර ගැනීමට හැකි වන පරිදි යම් රැඳවුම් ගාස්තුවක් ලබා ගන්නා ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ද පවසා සිටියේ පිට්ටනිය විනාශ වීමට ඉඩ දිය නොහැකි අතර, වැඩි මුදලක් රැඳවුම් ගාස්තු වශයෙන් ලබා ගන්නා ලෙසයි.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා, 2019 වර්ෂයේ අවසන් සංගීත ප්‍රසංගය මෙම පිට්ටනියේ පැවැත් වූ අතර, ඉන්පසු කණ්ඩායම් තුනක් විසින් සංගීත ප්‍රසංග සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කළ නමුත් පාසල් දරුවන්ට ක්‍රීඩා කිරීම සඳහා පවතින එකම ක්‍රීඩාංගනය බැවින් සංගීත ප්‍රසංග සඳහා ක්‍රීඩා පිට්ටනිය ලබා නොදීමට සභා තීරණයක් ගත් බව ද එසේ ලබා ගෙන තිබිය දී නැවත ප්‍රසංග සඳහා ලබා දෙන්නේ නම් ඉහත කී කණ්ඩායම් තුනට අසාධාරණයක් වන බව ද එක් වතාවක් ප්‍රශ්නයක් ඇති වී ජේසීබී රියදුරු පවා ඉවත් වූ බව ද අවශ්‍ය නම් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම සුද්ද කර ලබා දෙන ලෙස ද මෙම යෝජනාවට තමන් විරුද්ධ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් සභාවට යෝජනාවක් පමණක් යොමු කළ අතර, සභාව විසින් අවශ්‍ය තීරණය ගන්නා ලෙස ද පිට්ටනිය ලබා දෙන්නේ නම් කොන්දේසි පිළිබඳව තීරණය කරන ලෙස ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කොරෝනා වසංගතය හේතුවෙන් මිනිසුන් හිර වී සිටින බැවින් ඔවුන්ගේ මානසිකත්වය පිළිබඳව සිතිය යුතු අතර, හැමදේටම විරුද්ධ නොවී රට ගැන සිතිය යුතු බව ද එක් අවස්ථාවක තමන් විසින් පිට්ටනිය ලබා දී වැස්සක් නිසා අත්විඳි දේ දන්නා බව ද ටිකට් අලෙවි කරන්නේ නම් 20%ක් සභාවට ගත හැකි නමුදු එසේ කළහොත් මෙය පැවැත්වීම අපහසු බව ද රු.25,000.00 ලබා දෙන්නේ නම් එම මුදල ලබා ගෙන සභාව කැමති නම් සංගීත ප්‍රසංගය සඳහා පිට්ටනිය ලබා දෙන ලෙස ද වැස්සොත් නවත්වන ලෙස ද වැඩසටහන් ලක්ෂය යටතේ ෆැමිලියන් එක ඉදි කිරීම සඳහා මුල්ගල් තැබූ බව ද වැඩි කල් නොගොස් පිට්ටනිය සංවර්ධනය වන බව පෙනෙන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් හැමදේටම විරුද්ධ වනවා යැයි වැරදියට නොසිතන ලෙස ද තමන්ගේ දර්ශනය අනුව තමන් දකින විදිහ අනුව කතා කරන බව ද නගර සභා ක්‍රීඩා පිටිය ගරු අගමැතිතුමා පැමිණි අවස්ථාවක දී විශාල වශයෙන් විනාශ වූ බව ද තවත් අවස්ථාවක ස්ටේජ් එක වෙත ට්‍රක් රථයක් ගොස් විනාශ වූ බව ද අද වන විට දෛනිකව විශාල පිරිසක් ක්‍රීඩා කටයුතු වෙනුවෙන් මෙම ක්‍රීඩාංගනය භාවිත කරන බව ද ප්‍රසංගය වෙනුවෙන් ඉල්ලනු ලබන දවස මොනවගේ වෙයි ද යන්න නොදන්නා බව ද එම දිනයට පෙර හා පසු දින 03 ක් හෝ 04 ක් අදාල කාර්යයන් වෙනුවෙන් පිට්ටනිය ලබා දීමට සිදු වන බව ද ඇතුලත කෑම බීම කඩ පවා ඇති කළ හැකි බව ද මේ සඳහා රු. 25,000.00 ක මුදලක් සභාවට ලබා ගන්නවාට වඩා ප්‍රසංග සඳහා භාවිත කළ හෝප්වේල් ක්‍රීඩාංගනය ලබා දීම සුදුසු බව ද මේ සම්බන්ධව තම විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර, සංගීත ප්‍රසංගය සඳහා ක්‍රීඩා පිට්ටනිය ලබා දීම වෙනුවෙන් පක්ෂ හා විපක්ෂ බව විමසීමට බෙදීමක් යෝජනා කරන බව ද පැවසීය.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු 18 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩා පිටිය ලබා දීමේ යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙකු ද එනම්,

1. ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා

| | |
|---|---|
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් හතර දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි ගරු සභිකයින් දෙදෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා ද වේ. |

පහත සඳහන් සභිකවරුන් පස්දෙනා සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

ඒ අනුව 2022 මාර්තු 18 වන දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩා පිටිය ලබා දීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 06ක් ද, විපක්ෂව ඡන්ද 04 ක් ද වැළකී සිටීම් 02 ක් ද වශයෙන් වැඩි ඡන්ද 02 කින් සභා සම්මත විය.

**පෙ.ව. 10.55 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවෙන් පිටවෙන ලදී.**

ක්‍රීඩා පිටිය ලබා දීමේ දී අනුගමනය කළ යුතු කොන්දේසි පිළිබඳව තීරණයක් ගත යුතු බව ගරු සභාපතිතුමන් විසින් පැවසූ අතර, එහි දී ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා පැවසූ පරිදි මෙම කාර්යය සඳහා දින 04ක් පමණ වැය වන බැවින් රු. 25,000.00 ක මුදල රු. 50,000.00 දක්වා වැඩි කර අය කර ගැනීමටත්, යම් කිසි අලාභ හානියක් සිදු වුවහොත් පියවා ගැනීමට රු. 75,000.00 ක ආපසු ගෙවන තැන්පතු මුදලක් රඳවා ගැනීමටත් තමන් යෝජනා කරන

බව ද ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ නිර්දේශය ලැබුණහොත් පමණක් එම මුදල නිදහස් කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පිට්ටනියෙහි පිඩලි පවා විනාශ වුවහොත් නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමට එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් රු. 150,000.00 ක මුදලක් ආපසු ගෙවන තැන්පතු මුදලක් වශයෙන් තබා ගන්නා ලෙස පැවසීය.

එවැනි තත්ත්වයක් ඇති වුවහොත් වැය වන මුදල සම්බන්ධයෙන් වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව, සංගීත ප්‍රසංගය පැවැත්වීම වෙනුවෙන් රු.50,000.00 ක මුදලක් අය කර ගැනීමටත්, යම් කිසි අලාභ හානියක් සිදු වුවහොත් පියවා ගැනීමට රු. 100,000.00 ක ආපසු ගෙවන තැන්පතු මුදලක් රඳවා ගැනීමටත් ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ නිර්දේශය ලැබුණහොත් පමණක් එම මුදල නිදහස් කරන බව ද  වාහන ඇතුල් නොකිරීම ඇතුළුව ඇතුලත් කිරීමට ඇති සියලු කොන්දේසි සඳහන් කර ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී නැවතත් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම ප්‍රසංගය වෙනුවෙන් ක්‍රීඩා පිටිය ලබා දුන් පසු ඉදිරියේ දී නැවත වෙනත් අය විසින් මෙවැනි කටයුතු සඳහා ඉල්ලා සිටියහොත් අද දින ගනු ලබන තීරණය එදිනටත් වලංගු වනවාද? යන්න විමසූ අතර, මල් අලෙවිසැල්, ලී බඩු අලෙවිසැල් ආදිය සඳහා ඉදිරියේ දී ඉල්ලා සිටිය හැකි බව ද ඒ සඳහා පෙරහුරුවක් අද දින පැවති බව ද පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මහ සභාවට යොමු කර අනුමැතිය ගැනීමේ දී ප්‍රමාද වන බැවින් ආණ්ඩුකාරතුමාගේ මැදිහත්වීම මත ක්‍රීඩා පිටිය ලබා දීම සම්බන්ධ යෝජනාව විශේෂ සභාව සඳහා යොමු කිරීමට සිදු වූ අතර, ආදායම් උත්පාදනය සභාවේ මූලික අරමුණක් බව ද ප්‍රශ්නය තමන්ගේ නොවන තාක් කල් උත්තරය දාර්ශනික වන බව ද අවශ්‍ය අවස්ථාවල දී විවෘතව කතා කරන අතර, හොරු බොරු වංචා නොමැතිව විනිවිදභාවයෙන් තමන් කටයුතු කරන බව ද පවසමින් අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.10 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.